**පිළිතුරු පත්‍රය**
**10 ශ්‍රේණිය**
**තෙවන වාර පරීක්ෂණය**
**සිංහල සාහිත්‍ය රසාස්වාදය**

1.

(i)

(අ) කුස කුමාරයා , මහ බෝසතාණෝ

(ආ) පන්සිය පනස් ජාතක පොත

(ii)

(අ) ඇතුළත පිටත දිව රෑ හැරෙය  දුක්'ඳුරු

(ආ) දියනෙත - සූර්යයා,ඉර

මෙදියත - මේ ලෝකයෙහි

(iii)

(අ) "වෙසක් පහන" කෙටිකතාවෙහි කථකයා

(ආ) දුප්පතුන් නැති ලෝකය

(iv)

(අ) ජුවානිස් ආතා

(ආ) මහගම සේකර

(v)

(අ) ඇස් මහින්ද හිමි, කොළඹ යුගයේ මුල් පරපුර  **( එක පිළිතුරකට 1 බැගින් 1 x 2 = 2 )**

(ආ) කුල මල උගුල් අටවන,බොරු බණ කියා ගම්මුන්ගේ සමඟිය නැති කිරීමට උපායන් යොදන නිලධාරීන්ට.

**( ලකුණු - 4 × 5=20 )**

2.

(i) රජුන්ට කරන මෙහෙය / රාජ්‍ය සේවය

**( ලකුණු - 04යි )**

(ii) බෝධිසත්වයන්ගේ ආනුභාවයෙන් සුවඳ පැතිරෙන සේ දුම් කරවූ නිසා / තෙම්පරාදු කරවූ නිසා

**( ලකුණු - 04යි )**

(iii) * මසුරන් දහසක් ලබා දීමට.
* රජුන්ට හා දරුවන්ට බත් මාළු පිස ඒවා රැගෙන ඒමට අවස්ථාව ලබාදීම.

**( කරුණු 02 ඡේදයෙන් උපුටාගෙන තිබුණද ලකුණු පිරිනමන්න.)**
**( ලකුණු 06 යි. )**

(iv) ප්‍රභාවතිය දැක ගැනීමට අවස්ථාවක් ලැබීම.
**"මෙතැන් පටන් ප්‍රභාවවතින් දකිමි........"**

**( උද්ධෘතය උපුටා ගැනීමට ලකුණු 02 යි කෙටි පැහැදිලි කිරීමට ලකුණු 04 යි )**
**(ලකුණු 02 + 04 = 06යි)**

**නැතහොත්**

(i) නිසඳැස් කාව්‍ය ආකෘතිය

**( ලකුණු 04 යි )**

(ii) "ඔබ යනු මොබ එනු"

"සාලයෙන් කාමරයට

කාමරයෙන් සාලයට"

"පෙනෙයි

ඇසෙයි

දැනෙයි"

"නොරුඳෙයි පලා යෙයි"

**( ලකුණු 04යි )**

(iii) "හිස නවා ගති ඈ

සිහින් රතැඟිලි පටලවා ගති"

"විළිබරය මගේ රන්වන් මනාලිය"

"නොරුඳෙයි පලා පලා යෙයි"

**(උද්ධෘත සහිත කෙටි පැහැදිලි කිරීමට ලකුණු 06 යි )**

"හිස නවා ගති ඈ"

"දැල් තිර අස්සෙන් පෙනෙයි ඈ"

"පටපිළි අභරණ පෙට්ටි ගෙන" "නොරුඳෙයි පලා යෙයි"

**(උද්ධෘත සහිත කෙටි පැහැදිලි කිරීමට ලකුණු 06 යි )**

## II පත්‍රය පිළිතුරු

1.

- සුන්දර හාමි නම් අව්‍යාජ මිනිසාගේ ආගන්තුක සත්කාරය පිළිබඳව වරදවා වටහාගෙන, ඔහුට මුදලකින් සංග්‍රහ කිරීම පිළිබඳව කථකයාට ඇතිවූ ලැජ්ජාව මේ සඳහා වස්තු විෂය වී තිබේ.

**"පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්"**

**"ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුති**

**සිහිවී මගේ කම්මුල රතු පැහැය ගති"**

**( අත්දැකීම විස්තර කර ඇත්නම් ලකුණු 04යි. )**

**( උදාහරණය ලබාදී ඇත්නම් ලකුණු 02යි. )**

**( ලකුණු 04 + 02 = 06 )**

- සරල බව හා අව්‍යාජ බව

**"එනවා දිටිමි මිටි බැඳගෙන වියළි දර"**

**"දර ටික තබා සෙවණැති පලු ගසක යට**
**පිස දමදමා දාඩිය එන නළල පිට**
**මා එනතුරුම පෙන්නූ ඒ සිනහ කට**
**තවමත් පෙනේ දුක් දොම්නස් අතර මට"**

**"පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්"**

**"මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතෙකු ලෙසින් "**

**"පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්"**

**"පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ"**

**"දුන් සත පණහවත් නැත ඔහු පිළිගත්තේ"**

( විස්තරයට ලකුණු 03යි. )
( උදාහරණවලට ලකුණු 03යි. )
( ලකුණු 03 + 03 = 06 )

- කවියක පද පෙළ ගස්වන ආකාරය අනුව බාහිරට දිස්වන හැඩය ආකෘතියයි.විමලරත්න කුමාරගමයන් මේ සඳහා යොදාගෙන ඇත්තේ "සිව් පද කාව්‍ය ආකෘතියයි" පද්‍ය පාද හතරකින් යුතු මෙම ආකෘතිය තුළ පද්‍යාවසනයේ එළිසමය දක්නට ලැබේ.

( විස්තරයට ලකුණු 04 යි. )
( උදාහරණ 01 ට ලකුණු 02 යි. )
( ලකුණු 04 + 02 = 06 )

* සරල භාෂා භාවිතයක් දක්නට ලැබේ.

**"ඔහුගේ ගමට මා ගිය ඒ පළමු දින"**

* ගැමි කටවහර යොදා ගැනීම

**"හුවක් තරම්"**

* අනුප්‍රාසාත්මක භාෂා භාවිතය.

**"පිස දම දමා"**

( විස්තරයට ලකුණු 03යි. )
( උදාහරණ වලට ලකුණු 03යි. )
( ලකුණු 03 + 03 = 06යි. )

- මිනිසුන්ගේ උදාරත්වයට මිලක් නියම කළ නොහැකි බව.

**"ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුති**
**සිහිවී මගේ කම්මුල රතු පැහැය ගති"**

* දිළිඳු මිනිසුන් අතරේ තවමත් උසස් පුරුෂාර්ථයන් ශේෂව පවතින බවත් උගත් පොහොසත් යැයි සම්මත මිනිස්සුන්ට එය දැනුවත් කිරීමටත් කවියා උත්සාහ කර ඇත.

**"පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්"**

* දුක් දොම්නස් මැද වුවද සිනාසීමට හැකි බව.

**"මා එනතුරුව සිට පෙන්වූ සිනහ කට"**

**( විස්තරයට ලකුණු 03යි. )**
**( උදාහරණවලට ලකුණු 03යි. )**
**(ලකුණු 03 + 03 = 06 යි )**

- ප්‍රශ්න පත්‍රයේ සඳහන් පිළිවෙලටම අනුමාතෘකා යටතේ පිළිතුරු සපයා නොතිබුණද තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරමින් පැදි පෙළ මැනවින් ග්‍රහණය කර තම අභිමතය පරිදි රසාස්වාදයක් ලියා ඇත්නම් සුදුසු පරිදි ලකුණු පිරිනමන්න.

2.

- කුස ජාතකයේ රසවිඳීමේදී අපූර්ව වාග් චිත්‍ර මැවීම සුලබව දක්නට ලැබේ.එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

* රන්කරුවාට රුවක් සැදීමට කියා තමාද රන් රුවක් සාදා එය රැගෙන එන ලෙස ඔහුට පැවසූ අවස්ථාවේදී රන්කරු එය දැක ජීවමාන රූපයක් යැයි රැවටීම.

**"දේවයන් වහන්ස බිසවුන් වහන්සේ තනිව වැඩ සිටි හෙයින් වැද්ද නො හෙමියි කීය."**

- රන් රුව රැගෙන ආ පුරුෂයින් විසින් මංහස සිටුවන ලද රුව දැක කුදු තොමෝ ප්‍රභාවති දැයි රැවටී එයට පහරක් ගැසීම.

**"මේ නොකීකරු දරුවෝ අප පැනට එවා තුමු මේ වෙලේ පළමු කොට ඇවිදින්...."**

* කුස රජු ඇතා පිට යාමේදී ප්‍රභාවතියට උසුළු විසුලු කිරීම.

**"....පිටිපස්සේ උන් ඇත් ගොව්වා ඉතා ම චපලය, මට උසුළු විසුළු පැයේ ය"**

* ප්‍රභාවතිය දැක ගැනීමේ ආශාවෙන් පොකුණේ බැස සිට "මම කුස රජය'යි" දිය රකුසෙකු සේ ඇගේ අත අල්ලා ගැනීම.

* අරක්කැමියාගේ අත වැසියෙකු ලෙස සිට බත් මාළු ගෙන යන වසුන් කඳ කර තබාගෙන යාමේදී පබාවතියගේ දොර සමීපයේහි පය පැටලී වැටී කෙඳිරිගාමින් සිටිමත්, ඔහු බැලීමට පැමිණි පබාවතියගේ මුහුණට කුස රජු කට පුරවා කෙළ ගැසීම.

**"බෝධිසත්වයන්ගේ ශ්වාසය පරීක්ෂා කරනු පිණිස නැඹුරු මුහුණ බැලුව. එසඳ කුස රජ්ජුරුවෝ කෙළ කටක් පුරාගෙන ප්‍රභාවතීන් මුහුණට දැමුහ"**

**(අදාළ උදාහරණය සඳහා ලකුණු 02 බැගින් ලකුණු 06යි.)**
**(ලකුණු - 02 × 03 = 06යි )**
**(එම උදාහරණ මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි.)**
**( ලකුණු - 02 × 03 = 06යි)**

**(භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.)**
**(නියමිත වචන සංඛ්‍යාව ( වචන 150 ) සහිතව ප්‍රමාණවත් පිළිතුරු සපයා ඇත්නම් ලකුණු 01යි.)**
**( ලකුණු - 6 + 6 + 2 + 1 = 15 යි )**

3.

* අතීතයේ පටන්ම **"වී ගොවිතැන"** ප්‍රධාන ජීවනෝපාය වූ නිසාම ඒ ආශ්‍රිත කාරණා ජනකවියාට වස්තු විෂය වී තිබේ.

* ගොයම් කැපීම සඳහා ගන්නා දැකැත්ත පවා දේවත්වයෙන් සලකා සතරවරම් දෙවියන්ගේ ආශිර්වාදය ලබා එම කාර්ය සිදුකිරීම.

**"රිදියෙන් තනලා"**

* ගොයම් පැළ සිටුවීමේ සිට අස්වනු නෙළන තාක් ඒවා රැක ගැනීම ගොවියාට ඉතා දුෂ්කර කටයුත්තකි. ඔහු දෙවියන්ට පවසන්නේ වෙල රැක දුන්නොත් බත් බුදින්නට හැකි බවයි.

**"ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ."**

* ගොයම් නෙළීමේ කාර්යයද ගොවියාට විශේෂ අවස්ථාවකි. මෙම ගොයම දිවා කාලයේදී ඉරත්, රාත්‍රී කාලයේදී සඳත් රැකදෙන බව ගොවියා සිතයි.එමෙන්ම කලට වෙලාවට ජලය අවැසි බැවින් කැලණි ගඟේ දිය පිළිබඳ සිහිපත් කරයි.

**"ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත"**

- **මෙවැනි කරුණු සහිතව උදාහරණ තුනක්වත් ඉදිරිපත් කරමින් සවිස්තරාත්මක පිළිතුරක් තිබිය යුතුය.**

*** අදාළ උදාහරණ සඳහා ලකුණු 02 බැගින් ලකුණු 06යි.**
*** මැනවින් විග්‍රහ කර ඇත්නම්.**
**( ලකුණු - 02 × 03 = 06යි )**

*** භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි. නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිතව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.**

**( ලකුණු - 6 + 6 + 2 + 1 = 15යි )**

4.

- ළමා මනෝභාවයන්ගේ ස්වභාවය.

* වෙසක් පහන කෙටිකතාවේ කථක දරුවාගේ සිතැඟි නිරූපණය කැපී පෙනේ වෙසක් උත්සවය වෙනුවෙන් අයියා පැටවුන් විස්සක් සහිත විශාල අටපට්ටම් කූඩුවක් සෑදීමත් එය ගමේ විශාලතම වෙසක් පහන වීමත් පිළිබඳ ආඩම්බරයෙන් පසු වීම ළමා සිතේ ස්වරූපයයි.

**"කූඩුවට අතු බැඳීම සඳහා අයියා ඇතැම් විට එය තුළට බැස්සේය.ඔහු උසින් මට වඩා අඟල් දහයකට වඩා උස වුවද ඔහුට ඇතුළට බැස සිටිය හැකි වන තරම් කූඩුව විශාල වීම අපගේ ප්‍රීතියට හේතු විය."**

* ළමා ලෝකයේ පවත්නා සොඳුරු ගැටුම් කෙටිකතාකරුවාගේ අවධානය යොමුවීම.

**"අයියා සැස පසෙක තැබූ උණ පතුරක් මා දක්නට පෙර නංගීතම දෙකුකුල යටට කොට සඟවා ගත්තාය."**

**"පියුරු දැමීමට මුහුණේ ගඳ යනවා ද? "**

**"කටේ හැටි කිරි අප්පුගේ හොඹු කට වගෙයි."**

* තම අත්වැරදීමකින්  වෙසක් පහන දැවී යාමත් එය නිවන්නට උත්සාහ කළ අයියාගේ අත පිළිසීමත් කථකයාට ශෝකජනක අත්දැකීම් ය.මෙබඳු සංකීර්ණ මනෝභාවයන් විදදරා ගැනීම ළමා මනසට ඔරොත්තු නොදෙන්නෙකි.

**"අත පිලිස්සීම නිසා අයියා මිය යා හැකි යැයි මා තුළ බියක්ද ශෝකයක් ද ඇති විය."**

**" අයියා දොස්තර ගෙදරදී ගෙදරදී මල හෙයිනැයි මට සිතිණ.."**

**( ඉහත අවස්ථා අතරින් සුදුසු උදාහරණ තුනක් (03) තිබීම ප්‍රමාණවත්ය. )**
**( අදාල උදාහරණ සඳහා ලකුණු 02 බැගින් ලකුණු 06යි )**
**( ලකුණු - 02 × 03 = 06 )**
**( මැනවින් විග්‍රහ කර තිබීම ලකුණු 06යි.)**
**( ලකුණු - 02 × 03 = 06 )**
**( භාෂා නිරවද්‍යතාව ලකුණු 02යි. )**
**( නියමිත වචන සංඛ්‍යාව (වචන 150 ) සහිතව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි. )**
**( ලකුණු - 6 + 6 + 2 + 1 = 15යි )**

5.

- ස්වභාව ධර්මය පාදක කර ගනිමින් මානව චර්යාවන්ගේ ස්වභාවය මැනවින් විග්‍රහ කිරීමේදී  **"වැහි වළාකුල"** පැදි පෙළ තුළ දැකිය හැකි විශේෂ අවස්ථා.

* මිනිස් සමාජයේ සුදන, දුදන, උසස් පහත් චරිතයන්ගේ ස්වභාවය විවරණය කරයි.

**"සිරුරු පෑයෙනු ' ගත් සුද ලොවේ**

**නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා."**

* සුදන ඇසුර ලබන දුදන පුද්ගලයන් ද නිරායාසයෙන් උසස් ගුණධර්ම පුරුදු පුහුණු වන බව.

**" කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ**

**කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්**

**මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්**

**නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්,"**

* සමාජයට වැඩදායි සේවයක් සපයන්නෝ නිරන්තරයෙන් ස්වභාවධර්මයේ පවා ආශිර්වාදයට ලක් වෙති.

**"ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්**

**'ඔබැ'ඨ අන් කිසිවෙක් නිසි නෑ ' කියා**

**විදුලියත් පැහැ පත් රන දම් සෙයින්**

**පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්."**

**( මෙවැනි සුදුසු උදාහරණ තුනක් සහිතව පිළිතුරු ලබාදීම ප්‍රමාණවත් ය. )**
**( අදාල උද්ධෘත සඳහා එක් උදාහරණයකට ලකුණු 02 බැගින් ලකුණු 06යි. )**
**( ලකුණු  - 02 × 03 = 06යි )**
**( මැනවින් විග්‍රහ කර ඇත්නම් ලකුණු 06යි )**
**(භාෂා නිරවද්‍යතාවය සඳහා ලකුණු 02යි. )**
**(නියමිත වචන සංඛ්‍යාව (වචන 150) සහිතව ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි. )**
**( ලකුණු  06 +06+02+01=15යි )**